Cover Story

# අපේ හමුවීම
## සංසාරගත බැඳීමක්.....

# අමිල තේජා

**ඇගේ මුවගෙහි විකසිත වන සුන්දර සිනහරැල්ල, කාන්තිය කඩා හැලෙන නෙත් සැල්ම, රුවැත්තියක සතු සොඳුරු පියකරු බව මොනවට කියාපායි. සැබැවින්ම ඈ........ සුන්දර යැයි හැගෙන්නේ ඒ නිසාම පමණක් නොවේ. ඈ මුණ ගැසෙන කාට වුවද සිතෙන්නේ දිගු කලක් ඇසුරු කළ හැඟීමකි. ඒ , ඈ වෙතින් දිස්වන සුහද, සරල බව නිසාමය.**

එබඳු සොඳුරු යුවතියක්, තම ජීවන සහකාරිය ලෙස තෝරා ගන්නට ඔහු ගත් තීරණය නිවැරදි යැයි අපට සිතෙන්නේ ඒ නිසාමය.
ඔහු..... තාරුණ්‍යය මූර්තිමත් කරමින් රසික ආකර්ශණය නොමඳව දිනාගත් අමිල අබේසේකරය.
ඔහු අතිනත ගත් ඇය, එමිරේට්ස් ගුවන් සේවයේ තේජා ජයවර්ධනය.

පන්නිපිටිය, පැලවත්තේ ඔවුන් ගේ නව කැදැල්ලේ සොඳුරු කතා බහක අප රැඳුණු මොහොතකි මේ.



